18

# තැනට ගැළපෙන ලෙසින් හැසිරෙමු

බුදුරජාණන් වහන්සේ ධරමාන වූ අවදියෙහි දඹදිව සොළොස්මහ ජනපදවලින් එකක් වූ අඟු රට චම්පා නුවර සෝණ දණ්ඩ නම් ඉතා ධනවත් උගත් එසේ ම රූමත් වූ වයෝවෘද්ධ බ්‍රාහ්මණයෙක් විසුවේ ය. කොසොල් මහ රජතුමන් විසින් චම්පා නුවරින් ම පුදන ලද ඔහු ඉතා කීර්තිමත් අයෙකු ද විය. දිනෙක චම්පා නුවර ගග්ගරා නම් පොකුණු තෙරට බුදුරජාණන් වහන්සේ වැඩම කොට සිටින බව දැනගත් සෝණ දණ්ඩ බමුණු තෙමේ, උන් වහන්සේ තමා හමුවට ඒම නුසුදුසු බව ද තමා උන් වහන්සේ හමුවට යා යුතු බව ද පෙන්වා දෙමින් සිය පිරිස අමතා බුදුරදුන්ගේ චරිතයෙහි ප්‍රකට වන විශිෂ්ට ගුණාංග මාලාවක් ප්‍රකාශ කළේ ය. මේ සෝණ දණ්ඩ විසින් පවසන ලද එම ගුණාංග අතුරෙන් දෙකකි.

"ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ වූ කලී යහපත් වදන් ඇත්තෝ ය. යහපත් වූ කථා බස් ඇත්තෝ ය. යහපත් මිහිරි වචන කියන්නෝ ය. උන් වහන්සේගේ කථාබහ දොස් රහිත ය. කෙළ තොලු බවින් තොර ය. අරුත් හෙළි කිරීමෙහි සමත් ය. මට සිලිටි ය."

"ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ තමන් වෙත පැමිණෙන්නවුන් 'එන්න මෙහි පැමිණීම මැනවැ 'යි කියා පිළිගනිති. කනට සුවදෙන මිහිරි වචන පවසති. උන් වහන්සේ පිළිසඳර කථාවෙහි ද දක්ෂ ය. (නොසතුටින්) බැම නොහකුළුවති. සවිස්තර ව කථා කර යමකු තමා වෙත එනවිට පළමු ව කථා කරති."

බුදු දහම අනුව අප අනුන් හා පවත්වන කථා බස් දුර්භාෂණ හා සුභාෂණ යනුවෙන් දෙයාකාර ය.

බොරු කීමෙන් වැළකීම, ඇත්ත කීම, ඇත්තෙන් ඇත්ත ගළපා කීම, තහවුරු කළ හැකි කථා බහ, පිළිගත හැකි වචන භාවිතය, අනුන් නොරැවටීම සුභාෂණයයි. කේලාම් කීම හැරදමා, ඉන් වැළකී, මෙතැනින් අසා එතැනද එතැනින් අසා මෙතැනද ඔවුනොවුන් බිඳුවීම පිණිස නොකියා එසේ භේද වූවන් සමගි කරන, සමගි වූවන්ට අනුබල දෙන සමගිය දැක සතුටු වෙමින් අනුන් සමගි කරන වචන කීම සුභාෂණයයි. රළු කතා හැරදමා ඉන් වැළකී, නිදොස්, කනට මිහිරි, ආදරය මතු කෙරෙන, සිත් ඇද ගන්නා සුළු බොහෝ දෙනාට ප්‍රිය මනාප වචන කීම සුභාෂණයයි. අරුත් සුන් හිස් වචන දෙඩවිලි හැරදමා තැනට සුදුසු සත්‍යවාදී අර්ථවත් වූ යහපත ම සලසන, සිත් තබා ගැන්මට සුදුසු වූ කරුණු සහිත ඉමක් කොනක් ඇති කතාබහ සුභාෂණයයි. ප්‍රිය වචනයෙන් අන් අයට සංග්‍රහ කිරීමයි.

බුදුරජාණන් වහන්සේගේ ප්‍රියශීලී වූත්, අතිශය කාරුණික වූත්, ළගන්නා සුළු කතා බහ අපට ඇති උසස් ම ආදර්ශයයි. එසේ ම වචන භාවිතය පිළිබඳ ව උන් වහන්සේ දී ඇති උපදෙස් අපට ඇති උතුම්ම මග පෙන්වීමයි.

මානව සබඳතා මැනැවින් පවත්වාගෙන යාමට නම් අප මනා අවබෝධයෙන්, ප්‍රවේශමෙන් හා ස්ථානෝචිත ව වචන භාවිත කළ යුතු ය. අප කතා කරන වචනවල ඇතුළත් විය යුතු ප්‍රධාන අංග තුනක් ඇති බව මජ්ඣිම නිකායේ අභයරාජ සූත්‍රයේ එන කරුණු සාරාංශ කිරීමේ දී පෙනී යයි.

1. කතා කරන කරුණු සත්‍ය විය යුතු ය.
2. හේතු සාධක සහිත විය යුතු ය.
3. අසන්නාගේත්, කියන්නාගේත් යහපත පිණිස හේතු විය යුතු ය.

මෙම කරුණු තුනෙන් එකක් හෝ නොමැති නම් එම වචන කතා නොකළ යුතු ය. එබැවින් අප පාසල, පන්සල වැනි ස්ථානවල දී සේ ම නිවසේ දී ද හැසිරිය යුතු හා කතාබහ කළ යුතු ආකාරය පිළිබඳ මනා අවධානයක් යොමු කළ යුතු වේ.

විහාරස්ථානයක දී නම් ඔබ ඉතා සංවර ව හැසිරිය යුතු අතර වචන භාවිතය විහාරස්ථ පරිසරයට ද අපේ සංස්කෘතියට ද උචිත වන අයුරින් විය යුතු ය. ඇතැම් භාරතීය පැවිද්දන් හැඳින්වීම සඳහා භාවිත කළ "සාධු" යන වචනය භික්ෂූන් වහන්සේ නමක් ආමන්ත්‍රණය කිරීම සඳහා කිසි සේත් ම උචිත නොවේ.

ස්වාමීන් වහන්ස,
හාමුදුරුවනේ, අපේ හාමුදුරුවනේ,
හාමුදුරුවන් වහන්ස

යනා දී භාවිතයන් භික්ෂූන් වහන්සේ නමක් හැඳින්වීම සඳහා බෙහෙවින් ම යෝග්‍ය වේ. ස්වාමි යනු ලෝක ස්වාමී වූ බුදුරජාණන් වහන්සේ ය. උන් වහන්සේගේ දරුවෝ එනම් බුද්ධ පුත්‍රයෝ ස්වාමි දරුවෝ ය. එය අපේ වහර තුළ හාමුදුරුවෝ යනුවෙන් භාවිත වෙයි.

ඇතැම් අය පොඩි හාමුදුරුවන් වහන්සේලා හැඳින්වීමට "පොඩි සාදු" යන වචනය ද භාවිත කරති. එය ද සුදුසු භාවිතයක් නොවේ. එසේ ම වැඩිහිටි භික්ෂූන් වහන්සේ නමක්, සාමණේරයන් වහන්සේ නමකට ආමන්ත්‍රණය කරන "පොඩි උන්නාන්සේ" යන වචනය ද ගිහි අපගේ භාවිතයට සුදුසු නොවේ. "පොඩි හාමුදුරුවනේ, පොඩි ස්වාමීන් වහන්ස" යනාදී වචන ඒ සඳහා සුදුසු වේ. භික්ෂූන් වහන්සේ නමක් ආමන්ත්‍රණය කිරීමේ දී මෙන් ම උන් වහන්සේලා ගැන කතා බහ කිරීමේ දී ද සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ භාවිත වන විශේෂ ශාසනික ව්‍යවහාර ඇත.

| | | |
|---|---|---|
| සිටිනවා | - | වැඩ සිටිනවා |
| නිදා ගන්නවා | - | සැතපෙනවා |
| අතු ගානවා | - | අමදිනවා |
| අනුභව කරනවා | - | වළඳනවා |
| තේ බොනවා | - | ගිලන්පස වළඳනවා |
| ඇවිදිනවා | - | සක්මන් කරනවා |
| ඇඳුම් අඳිනවා | - | සිවුරු පොරවනවා |
| කියනවා | - | දේශනා කරනවා / වදාරනවා |

එසේ ම විහාරස්ථානයේ ඒ ඒ අංග නම් කිරීමේ දී චෛත්‍ය රාජයාණන් වහන්සේ, බෝධීන් වහන්සේ, විහාර මන්දිරය, මළුව යනාදී ශාසනික වචන භාවිත කළ යුතු ය.

බෞද්ධ දරුවන් වන අපට පාසල ද පන්සල මෙන් ම වැදගත් ස්ථානයකි. අපේ නුවණැස පාදන අධ්‍යාපන කේන්ද්‍රස්ථානය පාසලයි.

එබැවින් පන්ති කාමරයේ දී, පුස්තකාලයේ දී හා ක්‍රීඩා පිටියේ දී මිතුරන් මවුපියවරුන් සමග අප කතා බහ කිරීම හා හැසිරීම කළ යුත්තේ ද පාසලට යෝග්‍ය වන අයුරින් ය. ක්‍රීඩාවේ යෙදී සිටිය ද අප ක්‍රීඩා කරන්නේ පාසල් භූමියේ බව තරයේ සිතෙහි තබාගත යුතු ය. සිත් රිදවන, ප්‍රකෝප කරවන, වෛරය ඇති කරවන නොමනා විහිළු තහළු භාවිත නොකළ යුතු ය.

සැම විටෙක ම සිය සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ආශීර්වාද කිරීමේ දී "ආයුබෝවන්! තෙරුවන් සරණයි!" යනාදී වදන් භාවිතයට හුරුවීම ඉතා වැදගත් ය. කණට ප්‍රිය ය.



අප ජීවත් වන නිවස ද මානසික පීඩාවලින් තොර ඉතා ප්‍රියශීලී ස්ථානයක් විය යුතු ය. ඉගෙනීමේ කටයුතු පහසු මගකට යොමු කරවීමට නිවස ආශ්‍රිත පරිසරය ද බෙහෙවින් ම බලපායි. එබැවින් උදේ සවස තෙරුවන් නැමදීම, දෙමවුපියන්ට හා වැඩිහිටියන්ට වැඳීම, ඔවුන්ගේ බසට අවනත වීම, නිවස ඉතා පිළිවෙළකට හා පිරිසිදු ව තබා ගැනීම මැනැවින් සිදු කළ යුතු වෙයි. එවිට ආගන්තුක ව පැමිණෙන අයට පවා අපේ නිවස ප්‍රියමනාප ස්ථානයක් බවට පත්වනු ඇත. ඔවුන් සමග කාරුණික ව, ප්‍රියශීලී ව කතා බහ කිරීම ද අනිවාර්යයෙන් ම සිදුවිය යුත්තකි.

| | |
|---|---|
| තම නිවසට | පැමිණි |
| සැම දෙනහට ම | කුලුණෙනි |
| කතා බස් | කරමිනි |
| අසන් තොරතුරු සුදුසු | විදියෙනි |

යනුවෙන් සිරිත් මල්දමෙහි එන කවිය ද ඊට මගපෙන්වීමක් කරයි.

අන් අයගේ සිත් දිනාගත හැකි වන පරිදි ස්ථානෝචිත ව ප්‍රියමනාප ව හැසිරෙන හා කතාබස් කරන තැනැත්තා කිසි ලෙසකින් හෝ තවෙකකුගේ දෝෂ දර්ශනයට ලක් නොවේ. ඒ නිසා ම ජීවත් වන සමාජයෙහි මනා පුද්ගල සබඳතාවක් ගොඩනැගෙයි. කවර සමාජයක හෝ වැරැදි කරන පුද්ගලයෝ සිටිති. පුද්ගලයන්ගේ දුර්වලකම්වලට පොදුවේ දෝෂාරෝපණ එල්ල කිරීම ශාසනික වශයෙන් බලන කල බරපතල වැරැද්දකි. අවිචාරී ව කරන එබඳු විවේචන හා දෝෂාරෝපණ නිසා සිත් තැවුලට ගොදුරු වීමෙන් ගිහි-පැවිදි දෙපක්ෂය ම බලවත් අපහසුතාවලට පත්වන අවස්ථා අපමණ ය. මානව සබඳතා මනා ව තහවුරු වීමට නම් අනෙකෙකු විවේචනය කළ යුත්තේ එයින් ඔහුට යහපතක් කිරීමේ අරමුණින් පමණකි. ද්වේෂය හා මෝහය පදනම් කරගෙන සිදු කරන විවේචන දෝෂාරෝපණ ආදියෙන් යහපතක් නොව අයහපතක් ම සිදු වනු ඇත. යහපත් මානව සබඳතාවක් පවත්වාගෙන යාමට නම් පුද්ගල වරදත්, වරදට හේතුවත් කියාපාමින් ඒවා නිවැරැදි කරලීමට සුදුසු මාර්ගයක් පෙන්වා දිය යුතු වේ.

මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය ක්‍රියාවට නැංවෙනුයේ යහපත් මානව සබඳතා පවත්වා ගනිමින් ලෝකයා සමග ක්‍රියා කිරීමෙන් පමණකි. බුදු දහම මානවයාට, සෙසු සත්ත්ව වර්ගයාට පමණක් නොව ගහකොළ, ගංගා, ඇළදොළවලට පවා දයාව, කරුණාව දක්වන ජීව අජීව හිතවාදී දහමකි. එබැවින් සියලු ජීවීන්ට ද පරිසරයට ද හිතකාමී ව ස්ථානෝචිත ව හැසිරෙමින් දෛනික ජීවිතය ඉතා ප්‍රියශීලී ව ගත කිරීමට අප උනන්දු විය යුතු ය.



## සාරාංශය

අප ජීවත් වන සමාජ පරිසරය තුළ සෑම දෙනෙකු සමග ම යහපත් මානව සබඳතා ගොඩනගා ගත යුතු ය. තමාත්, පොදුවේ ජන සමාජයත් නිවැරැදි මගට යොමු වීමට එය බෙහෙවින් ම බලපායි. ඒ අනුව කතා බස් කිරීම, හැසිරීම යනාදී සෑම ක්‍රියාවක දී ම ස්ථානෝචිත ව ප්‍රියශීලී පිළිවෙතක් අනුගමනය කළ යුතු ය. වෙසෙසින් පාසල, පන්සල, නිවස යන ස්ථානවල ප්‍රායෝගික ව ඊට ම ආවේණික හැසිරීම් හා කතා බස් රටාවක් අනුගමනය කළ යුතු වේ. සමාජයේ මනා පුද්ගල සබඳතාවකට මෙම පිළිවෙත බෙහෙවින් ම උපකාරී වෙයි.



## ක්‍රියාකාරකම

1. ඔබ එදිනෙදා භාවිත කරන මෙම වචන වෙනුවට ආගමික කටයුතුවල දී භාවිත කරන වචන සොයා ලියන්න.

    අත් සෝදනවා
    වතුර බොනවා
    වතුර නානවා
    කොණ්ඩෙ කපනවා

2. සහජීවනයේ අගය මතු කරමින් චිත්‍රයක් අඳින්න.



## පැවරුම

"යහපත් වචනය සමාජ සම්බන්ධතා තහවුරු කරයි" යන තේමාව යටතේ රචනයකට කරුණු රැස් කරන්න.